**ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව - 2025**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ ("සභාව") 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි සභාවේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක්වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවටවන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය.කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව

- සභාව සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2017 අංක 04 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනතේ | | | |
| | (i ) 14 (1) සහ 14(2) වගන්ති | 2025 වර්ෂයේ දී ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) හා ශ්‍රී ලංකා ව්‍යවස්ථාපිත ඉංජිනේරු ආයතනය (IIESL) යන ආයතන දෙකෙහි ලියාපදිංචි ඉංජිනේරු වෘත්තියේ නියැලෙන ඉංජිනේරු වෘත්තිකයන් 31,360 කින් 18,631 ක් එනම් සියයට 59 ක් පමණක් ඉංජිනේරු සභාවේ ලියාපදිංචිය ලබාගෙන තිබුණි. | IESL ආයතනයේ සියයට 76 ක් සභාවේ ලියාපදිංචි වී ඇත. ඉතිරි සාමාජිකයින් විදේශගත වීම, විශ්‍රාමයෑම, ඉංජිනේරුවරයකු වශයෙන් වෘත්තියේ නියැළීම සිදු නොකිරීම ආදී කරුණු නිසා ලියාපදිංචි වී නොමැති විය හැකිය. IIESL ආයතනයේ සියයට 27 ක් සභාවේ ලියාපදිංචි වී ඇත. මේ පිළිබඳව අවශ්‍ය පියවර ගන්නා ලෙස ඔවුන්ට උපදෙස් දී ඇත. | ශ්‍රී ලංකා ඉංජිනේරු, (IESL) හා ශ්‍රී ලංකා ව්‍යවස්ථාපිත ඉංජිනේරු, (IIESL) ආයතන දෙකෙහි ලියාපදිංචි සියලු සාමාජිකයින් සභාවේ ලියාපදිංචි වීමට ඉදිරිපත්වීම සඳහා පනතේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය වන ඵලදායී ක්‍රමවේදයන් හඳුන්වා දිය යුතුයි. |
| | (ii) v වන කොටසේ 21 වගන්තිය | සභාව විසින් අමාත්‍යවරයා විමසා සභාවේ කාර්ය මණ්ඩලය සඳහා ප්‍රධාන විධායක නිලධාරියෙක් 2026 අප්‍රේල් 30 දින | මෙවන විට සභාවේ පරිපාලනය සහ කාර්ය මණ්ඩලය පාලනය ඇතුළු සභාවේ වැඩ කටයුතු සහ පරිපාලනය, සභාවේ සියලු තීරණ ඉටු කිරීම | සභාවේ පනත සහ අනුමත කාර්ය මණ්ඩලය අනුව ප්‍රධාන විධායක නිලධාරි තනතුරට සුදුසු නිලධාරියෙකු |

| | | | | |
|---|---|---|---|---|
| | | දක්වා පත්කර නොතිබුණු අතර පරිපාලනය සහ කාර්ය මණ්ඩලය පාලනය ඇතුළු සභාවේ කටයුතු පරිපාලනය, සභාවේ සියළු තීරණ ඉටු කිරීම සඳහා වගකිව යුතු වීම සහ සභාව විසින් පවරනු ලැබිය හැකි සියලු කර්තව්‍යයන් ඉටුකිරීම යන කාර්යයන් ප්‍රධාන විධායක නිලධාරියාට පනත අනුව පැවරී තිබුණි. ඒ අනුව ආයතනයේ නිසි වැඩ බෙදීමක් සහිත අභ්‍යන්තර පාලන ක්‍රමයක් ඇතිවන අයුරින් මූල්‍ය බලතල පවරා නොතිබුණි. | වගකීම් සහගත අයුරින් ඉතා කාර්යක්ෂමව සිදුවෙමින් පවතී. තවද දැනට ආයතනයේ පැවැත්මට සුදුසු ආකාරයේ නිසි වැඩ බෙදීමක් සහිත අභ්‍යන්තර පාලන ක්‍රමයක් ඇතිවන අයුරින් මූල්‍ය බලතල පවරා ඇති බව. | පත් කිරීමට කටයුතු කළ යුතු අතර ආයතනයේ නිසි වැඩ බෙදීමක් සහිත අභ්‍යන්තර පාලන ක්‍රමයක් ඇතිවන අයුරින් මූල්‍ය බලතල පැවරිය යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන විගණන පනතේ 38(1)(ඇ) සහ 38(2) වගන්ති | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් එක් එක් ආස්ථිතායේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කළ ලිඛිතව සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කර එහි පිටපත් විගණකාධිපතිවරයාට ලබා දිය යුතු වුවද සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා සමඟ සාකච්ඡාවක් පවත්වන ලද අතර එම සාකච්ඡා සටහන විගණනයට ඉදිරිපත් කර ඇති බව. | 2018 අංක 19 දරන විගණන පනතේ 38(1) (ඇ) සහ 38(2) වගන්ති අනුව ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර කාලීනව සමාලෝචනය සිදුකර විගණකාධිපති වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ | අමාත්‍යාංශය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සහ ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් පැමිණීම තහවුරු කර | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2013 හා 2013.10.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ව්‍යවස්ථාපිත ආයතන සඳහා අදාළ | සභාව සඳහා පරිපාලන අත්පොතක් සකස් කර අනුමත කර නොමැති බැවින් නිවාඩු දින සේවය කිරීම හා නිවාඩු දින |

| | | | | |
|---|---|---|---|---|
| | 10:1 උප වගන්තිය සහ ඊට අදාල සංශෝධන | නොගෙන 2025 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සති අන්ත හා රජයේ නිවාඩු දින 96 ක් රාජකාරි කටයුතු ඉටු කිරීම වෙනුවෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරිනියට මාසික වැටුපෙන් 1/20 ක් බැගින් එකතුව රු.428,156 ක් නිවාඩු දින වැටුප් ලෙසද රු.77,068 ක් ඒ මත සේවක අර්ථ සාධක අරමුදල් දායකය හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් දායකය ලෙස ගෙවා තිබුණි. | නොවේ. | වැටුප් ගෙවීම් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියලුම රාජ්‍ය ආයතනවල සේවක සංඛ්‍යාව නොසලකා ඇඟිලි සලකුණු ස්කෑනර් භාවිතා කරමින් නිලධාරීන් කාර්යාලවලට පැමිණීම සහ පිටවීම තහවුරු කිරීමේ වාර්තා තබා ගත යුතු වේ. එසේම චක්‍රලේඛයෙහි 04 ඡේදයට අනුව අතිකාල සහ නිවාඩු වැටුප් වැනි සාමාන්‍ය රාජකාරි වේලාවන්ගෙන් පිටත සිදු කළ රාජකාරි සඳහා ගෙවනු ලබන දීමනා සඳහා පැමිණීමේ සහ පිටවීමේ වේලාවන් පදනමක් ලෙස භාවිතා කරන්නේ නම්, ඇඟිලි සලකුණු යන්ත්‍ර හරහා පැමිණීම සහ පිටවීම තහවුරු කිරීම කළ යුතු වුවද එසේ නොකොට | අප ආයතනය තුළ අඩු සේවකයන් සංඛ්‍යාවක් ඇති නිසා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිත කිරීම ප්‍රායෝගික නොවේ. | චක්‍රලේඛය ප්‍රකාරව සේවක සංඛ්‍යාව නොසලකා ඇඟිලි සලකුණු ස්කෑනර් භාවිතා කරමින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම සහ පිටවීම තහවුරු කිරීම සහ ඒ අනුව ගෙවීම්වලට අදාළ කර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අත්සන් ලේඛනයක් පමණක් පවත්වා ගනිමින් නිවාඩු දින වැටුප්, අතිකාල දීමනා, ඉතිරිකරගත් නිවාඩු වෙනුවෙන් ගෙවීම් සිදු කර තිබුණි. | | |
| (ඉ) | 2025 මාර්තු 25 දිනැති අංක 01/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 13:3 වගන්තිය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරිනියට අදාළව නිවාඩු දින වැටුප් ගණනය කිරීම සඳහා එම චක්‍රලේඛයෙහි උපලේඛන I හි සඳහන් මූලික වැටුප මත 1/20 ක් ගණනය කර එම අගයෙන් 2/3ක ප්‍රමාණයක් ගෙවිය යුතු වුවත් එම චක්‍රලේඛයෙහි උපලේඛන I හි සඳහන් මූලික වැටුපෙන් 1/20ක ප්‍රමාණයක් ගෙවීම නිසා රු.119,798 ක අධිගෙවීමක් එම නිලධාරිණිය වෙත සිදු කර තිබුණි. | අංක 01/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 13:3 වගන්ති යටතේ සඳහන් නිවාඩු දින වැටුප්වල පූර්ණ අගය ගෙවීම රාජ්‍ය මූල්‍ය තත්ත්වය යහපත් වූ වහාම සිදු කරනු ලැබේ. 13:4 වගන්තියට අනුව ඉතිරි 1/3 ක ප්‍රමාණය රජයේ මූල්‍ය තත්ත්වය යහපත් වූ වහාම ගෙවිය යුතුය.අප භාණ්ඩාගාරයෙන් මුදල් ලබා නොගනී. අපගේ මූල්‍ය තත්ත්වය යහපත් වූ බැවින් මෙම 1/3 ක ප්‍රමාණය ගෙවන ලදී. මෙයට අදාළව අපට සිටින්නේ එක් නිලධාරියෙකු බැවින් මේ සඳහා වැයවන මුදල අපට දරා ගත හැකිය. | සභාව මූල්‍ය හා පරිපාලන අත්පොත් පිළියෙල කර අනුමත කරවා ගෙන නොමැති අතර නිවාඩු දින දීමනා 1/20 ගෙවීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විශේෂ අනුමැතියක් ලබා ගැනීමටද කටයුතු කර නොමැති බැවින් මෙම චක්‍රලේඛයට අනුකූලව නිවාඩු දින දීමනා ගණනය කර ගෙවීම සිදුකළ යුතු අතර වැඩිපුර ගෙවීම් අය කළ යුතුය. |
| (ඊ) | 2023 සැප්තැම්බර් 27 දිනැති අංක PED 01/2021(iii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සෑම ආයතනයක්ම එම ආයතනයට සුවිශේෂී පරිපාලන හා මූල්‍ය මාර්ගෝපදේශ හා අත්පොත් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද සභාව විසින් එම අත්පොත් සකස්කර අනුමත කරගෙන නොතිබුණි. | - | චක්‍රලේඛ උපදෙස් පරිදි සභාවට සුවිශේෂී පරිපාලන හා මූල්‍ය අත්පොත් සකස් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,938,515 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,234,065 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,704,450 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම එනම් සාමාජිකයන් ලියාපදිංචි කිරීමේ ආදායම රු.2,328,157 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂය හා සංසන්දනය කිරීමේ දී මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ආදායම් රු.2,328,157 කින් එනම් සියයට 11.03කින් වැඩි වී තිබුණු අතර, ගිවිසුම්ගත සේවා හා නඩත්තු වියදම් සහ අනෙකුත් මෙහෙයුම් වියදම් පිළිවෙලින් සියයට 10.55 කින්ද සහ 10.13 කින්ද අඩු වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

සභාවේ ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේ 14:1 හා ඉකුත් වර්ෂයේ 13:1 ක් වූ අතර ශුද්ධ ලාභ අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී සියයට 5.28 කින් වැඩිවීමට ආදායමේ ඉහළයාම සෘජුවම බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජුලි 09 දින සිට සභාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුර සඳහා කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ JM 1-1 වැටුප් කේතය යටතේ නිලධාරිණියක් බඳවාගෙන පසුව මධ්‍යම කළමනාකරණ මට්ටමේ MM 1-1 වැටුප් කේතයට 2021 ඔක්තෝබර් 15 දින සිට පත් කර තිබුණි. අනතුරුව HM 1-3 වැටුප් කේතය යටතේ ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුරේ රාජකාරි ඉටුකිරීම සඳහා 2022 ජුනි 27 දින සිට එම නිලධාරිණිය පත්කර තිබුණි. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS / 1850 හා 2022 ඔක්තෝබර් 18 දිනැති ලිපිය මගින් HM 1-3 වැටුප් කේතය යටතේ අනුමත ජ්‍යෙෂ්ඨ කළමනාකරන මට්ටමේ ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුර සඳහා බඳවා ගැනිම් සිදු | MM 1-1 වැටුප් කේතයේ පැවති ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිළධාරි තනතුර HM 1-3 වැටුප් කේතය දක්වා වැඩි කිරීමට වැටුප් කොමිෂන් සභාව නිර්දේශ කරන ලද අතර එයට අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් එය සිදුකර ඒ බව අප වෙත ලිපියකින් දැනුම් දෙන ලදී. ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරි තනතුර HM 1-3 වැටුප් කේතයට පරිවර්තනය කර තිබුණු නමුත් දැනට එහි සේවය කරනු ලබන්නේ MM 1-1 වැටුප් කේතයට අයත් නිලධාරිනියකි. එම නිලධාරිනි HM 1-3 වැටුප් කේතයට අවශ්‍ය සියලුම අධ්‍යාපන සුදුසුකම් ද මීට අතිරේකව වෘත්තීය සුදුසුකම් ද (Professional Qualifications) සපුරා තිබූ නමුත් අවශ්‍ය අවුරුදු 15 ක පළපුරුද්ද සම්පූර්ණ කර | MM 1-1 වැටුප් කේතය යටතේ දරන්නාට පෞද්ගලිකවන සේ අනුමත තනතුර පුරප්පාඩු වූ විට පමණක් HM 1-3 වැටුප් කේතය යටතේ වූ තනතුරට බඳවා ගැනීමට හැකිවන බැවින් එකවර තනතුරු දෙක සඳහාම බඳවා ගැනීම් නොකළ යුතුය. තවද රාජකාරි ඉටුකිරීමේ පත් කිරීම සඳහා අදාළ තනතුර පුරප්පාඩු වී තිබිය යුතුය. එම නිසා සේවා පළපුරුද්ද සම්පූර්ණ වීමෙන් පසු එම නිලධාරිනිය අනුමත ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය වන්නේ නම් බඳවා ගැනීමේ පටිපාටියට අනුව කටයුතු කළ යුතුය. |

කළ යුත්තේ MM 1-1 වැටුප් කේතය යටතේ දරන්නාට පෞද්ගලික වනසේ අනුමත කර තිබු තොරතුරු තාක්ෂණ නිලධාරි තනතුර පුරප්පාඩු වීමෙන් අනතුරුව වන අතර එකවර තනතුරු දෙක සඳහාම බඳවා ගැනීම් සිදු නොකළ යුතුය. තවද ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.5 උප වගන්තිය ප්‍රකාරව රාජකාරි ඉටුකිරිමට පත් කල යුත්තේ පුරප්පාඩු තනතුරු වහාම පිරවිය යුතු නම් පමණක් වුවද ඒ අනුව HM 1-3 කේතය යටතේ වන තනතුර සඳහා පුරප්පාඩුවක් නොපැවති අතර එකම රාජකාරිය බැවින් එක විට තනතුරු දෙකම ක්‍රියාත්මක කළ නොහැකි බව තවදුරටත් නිරීක්ෂණය විය. නමුත් අදාළ නිලධාරිනියට ඒ සඳහා රාජකාරි ඉටුකිරිමට පත්කර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රාජකාරි ඉටු කිරිමේ දීමනා, සේවක අර්ථ සාධක අරමුදලේ දායකය හා සේවක භාරකාර අරමුදලේ දායකය ලෙස පිළිවෙලින් රු.365,520 ක්, රු.54,828 ක් හා රු10,966 ක් වශයෙන් එකතුව රු.431,314 ක් ගෙවා තිබුණි. මේ සඳහා ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12.2.6 වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද HM 1-3 ශ්‍රේණියට අදාළ වාහන දීමනා ලෙස රු.600,000 ක්ද ඉන්ධන දිමනා ලෙස රු.414,920 ක් ද 2025 වර්ෂයේ ගෙවා තිබුණි. එමෙන්ම HM 1-3 වැටුප් කේතයට අවශ්‍ය සේවා පළපුරුද්ද වන වසර 15 සම්පූර්ණවන තෙක්ම රාජකාරී ඉටුකිරිම අඛණ්ඩව පවත්වා ගැනිමට සභාව විසින් තීරණය කර තිබුණි.

නොමැති නිසා එම නිලධාරිනියව අන්තර්ග්‍රහණය කර ගැනීම ද සිදු කළ නොහැකිය. කෙසේ වුවද, එම නිලධාරිනිය විසින් HM 1-3 වැටුප් කේතයට අදාළ සභාවේ කාර්යභාරයන් ඉතා කාර්යක්ෂමව සිදු කරමින් පවතී.

2022 සැප්තැම්බර් 6 වන දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් යෝජනා කරන ලද්දේ දැනට සේවය කරන ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරිනිය ඇය සිටින MM 1-1 වැටුප් කේතයේ රැඳී සිට HM 1-3 වැටුප් කේතයට අදාළ " වැඩ බැලීම" සිදුකළ හැකි බවය. එමෙන්ම එයට අදාළ තීරණය සභාව විසින් ගනු ලැබිය හැකි බවත්ය. ශ්‍රී ලංකා ඉංජිනේරු සභා පනතේ 22 වගන්තිය අනුව පැවරී ඇති බලතල අනුව දැනට සේවයේ යෙදී සිටින ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරිනිය ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13:5 වගන්තියේ සඳහන් පරිදි HM 1-3 වැටුප් කේතයට අදාළ වැඩ බැලීම "රාජකාරී ඉටුකිරීමක් ලෙස පත් කිරීමට සභාව මඟින් තීරණය කරන ලදී". ආයතනයේ තොරතුරු තාක්ෂණය මඟින් බෙහෙවින් යැපෙන අතර එහි තිරසර පැවැත්ම සළකා එම තනතුරේ සේවය කරන නිලධාරී HM 1-3 වැටුප් කේතයට අවශ්‍ය සේවා පළපුරුද්දවන වසර 15 සම්පූර්ණවන තෙක්ම රාජකාරී ඉටුකිරීම අඛණ්ඩව පවත්වා ගැනීමට සභාව තීරණය කරන ලදී. මෙය නීත්‍යානුකූල ලෙස පත්කරන ලද පත්වීමක් වේ.

එසේම විධිමත් නොවන පරිදි ගෙවන ලද දිමනා නැවත අයකළ යුතුය.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත තනතුරු 09 න් ප්‍රධාන විධායක නිලධාරී තනතුර ඇතුළුව තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතුණි. | මේ වන විට සභාවේ පරිපාලනය හා කාර්ය මණ්ඩලය පාලනය ඇතුළු සභාවේ වැඩ කටයුතු සහ පරිපාලනය, සභාවේ සියලු තීරණ ඉටු කිරීම වගකීම් සහගත අයුරින් ඉතා කාර්යක්ෂමව සිදු වෙමින් පවතින බව. | කාර්යභාරයට අනුව තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට හෝ අත්‍යවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 දරන රජය සතු ව්‍යාපාර සඳහාවන මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදයට පටහැනිව 2024 වර්ෂය සඳහා වූ සභාවේ වාර්ෂික වාර්තාව 2026 අප්‍රේල් මාසයවන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2024 වසර සඳහා වූ සභාවේ වාර්ෂික වාර්තාව 2025 ජූලි 31 වන දින නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය වෙත යොමු කරන ලද බව. | වාර්ෂික වාර්තාව චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් මාස 05 ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු බැවින් ඉදිරියේදී එම කටයුතු නොපමාව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |